# වයඹ පළාතේ පළාත් සභාවේ 2001 අංක 2 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය

( වයඹ ආණ්ඩුකාර තුමා අනුමත කළ දිනය : 2001.10.23)

2000 අංක 3 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම පිණිසද, එකී ප්‍රඥප්තියේ භාෂා පාඨ අතර අනනුකූලතා පිළිබඳ විධිවිධාන ඇතුළත් කිරීම පිණිස ද වයඹ පළාතේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයාට වැටුප් හා දීමනා ගෙවීම උදෙසා විධිවිධාන සැලැස්වීම පිණිසද එකී ප්‍රඥප්තිය තවදුරටත් සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

| | | |
|---|---|---|
| ලුහුඬු නාමය | 1. | මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2001 අංක 2 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. |
| වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම. | 2. | මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන ප්‍රඥප්තියේ දීර්ඝ නාමයේ "සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට, හා විපක්ෂනායකවරයාටද" යන වචන වෙනුවට "සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට, ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයාට හා විපක්ෂනායකවරයාටද" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. |
| ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය සංශෝධනය කිරීම. | 3. | ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් එය සංශෝධනය කෙරෙන අතර එය (ඇඇ) ඡේදය වශයෙන් බලපැවැත්විය යුතුය.<br><br>"(ඇඇ) වයඹ පළාතේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයාට ගෙවිය යුතු මාසික වැටුප සහ දීමනා තත්කාලයේ වයඹ පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයකුට ගෙවනු ලබන වැටුප් හා දීමනා සහ මසකට රුපියල් එක්දහස් පන්සියයක අතිරේක දීමනාවකට සමානවිද" |
| ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය සංශෝධනය කිරීම. | 4. | ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තියේ "සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට සහ විපක්ෂනායකවරයාටද" යන වචන වෙනුවට "සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට සභානායකවරයාට, ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයාට සහ විපක්ෂනායකවරයාටද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. |
| ප්‍රධාන ප්‍රඥප්තියේ 4 අලුත් වගන්තිය ඇතුළත් කිරීම. | 5. | ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය.<br><br>"අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව. — 4. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය." |
| අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව. | 6. | මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. |